# මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ 2023.01.09 දින පැවති මහා සභාවේ වාර්තාවයි.

2023.01.09 වන දින පෙ.ව 09.30 ට පමණ ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිණියගේ ප්‍රධානත්වයෙන් සභා කටයුතු ආරම්භ කරන ලදී.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
අද දින සභා රැස්වීම සඳහා පැමිණ සිටින ඔබ සියළුම දෙනා ඉතාමත් ආදරයෙන් පිළිගන්නා අතර ආගම සිහි කිරීමෙන් අනතුරුව සභා කටයුතු ආරම්භ කර සිටිමු.

## 01. පසුගිය සභා වාරයේ වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම සහ වාර්තාව සභා සම්මත කිරීම.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
මීළඟට පසුගිය සභා වාරයේ වාර්තාව සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
නොවැම්බර් මස පවත්වන ලද සභා රැස්වීමේදී මා විසින් ඉතා වැදගත් කරුණු දෙකක් සම්බන්ධයෙන් විශේෂ යෝජනාවක් ඉදිරිපත් කර තිබුණා. නල්ලතන්නිය ප්‍රදේශයේ වැඩි වෙමින් පවතින මත්පැන්හල් සම්බන්ධයෙන් කතා කර තිබුණා. ඒ සම්බන්ධයෙන් සභා වාර්තාවේ කරුණු ඇතුලත් වී නැහැ. තවද ගුරු හිඟය සම්බන්ධයෙන් ද සඳහන් කර තිබුණා. ඒ සඳහාද ලිපියක් පමණක් යොමුකර තිබෙනවා. ඒ පිළිබඳව මා කතා කළ කරුණු වාර්තාවේ සඳහන් වී නැහැ. නමුත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ විශේෂ යෝජනාව වාර්තාවේ ඇතුලත් වී තිබෙනවා. මේ සම්බන්ධයෙන් මා ඉතාමත්ම කණගාටු වෙනවා. කිසිම හේතුවක් මත විශේෂ යෝජනාව ඇතුලත් නොකරන බවට ගරු සභාපතිතුමිය පවසා තිබුණා.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
පස්ගිය සභා වාරයේ ගරු මන්ත්‍රීතුමාගේ විශේෂ යෝජනාව සම්බන්ධයෙන් අනෙකුත් මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම හේතුවෙන් ඒ සඳහා මා අනුමැතිය ලබා දුන්නා.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
මමත් ගරු මන්ත්‍රීවරුන්ගේ අත්සනින් යුතු ලිපියක් ඉදිරිපත් කර තිබුණා. එහෙත් මාගේ යෝජනාව වාර්තාවට ඇතුලත් වී නැහැ.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
පසුගිය මස සභා රැස්වීමේදී මා විසින් ආයුර්වේද රෝහල සම්බන්ධයෙන්ද, ගරු මන්ත්‍රී සුබ්‍රමනියම් මැතිතුමා විසින් නල්ලතන්නිය ප්‍රදේශයේ සේවය කරන ක්ෂේත්‍ර නිලධාරියා පිළිබඳවද අදහස් ඉදිරිපත් කර තිබුණා. එම කරුණු ද වාර්තාවේ සඳහන් වී නැහැ. මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළ බවට පමණක් සඳහන් වී තිබුණා. එම කරුණු සම්බන්ධයෙන් ගරු සභාපතිතුමිය විසින් පිළිතුරු දෙකක් ලබාදී තිබුණා. එක්ක එහි වැඩමකර සිටින නායක ස්වාමින් වහන්සේ විසින් එම සේවකයා සේවයට යොදවන ලෙසට ඉල්ලා සිටි බව පැවසුවා. අනික එහි සිටින සේවකයන් වැඩට යෙදවීමෙන් පමණක් එම කාර්යයන් විධිමත්ව කරගෙන යාමට හැකි බවට ඔබතුමිය සඳහන් කළා. පටිගත කිරීමට අනුව එම කරුණු වාර්තාවේ සඳහන් වී තිබුණානම් වඩාත් සුදුසුයි.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

ගරු මන්ත්‍රීවරුන් විසින් අදහස් ප්‍රකාශ කරන ලදී, යනුවෙන් සභා වාර්තාවේ පිටු දෙකකට වඩා සඳහන් වී තිබෙනවා. මෙහි ඉදිරිපත් කළ කරුණු ඉහළ ආයතන වෙත යොමු වෙනවාද?

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**

යෝජනාවේ ඇතුලත් කරුණු සියල්ල වාර්තාවේ ඇතුලත් කරනවා.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

කෙසේ වෙතත් වැදගත් අදහස් ඉදිරිපත් කරන අවස්ථාවේදී එම කරුණු ඉහළ ස්ථානවලට යොමු විය යුතුයි නේද? පටිගත කිරීම සඳහා පමණක් කතා කිරීමෙන් කිසිදු ඵලක් නැහැ.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**

යෝජනා සම්බන්ධ සියළු කරුණු ඇතුලත් කරනවා. ඊට වැඩි මනක් වශයෙන් ඉතා වැදගත් කරුණු ඇත්නම් ඒවාද ඇතුලත් කළ හැකියි.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

යම් කිසි ලිපියක් ඉදිරිපත් කරන අවස්ථාවේදීද ඒ ස්මබන්ධයෙන් සාකච්ඡා කර වැදගත් තීරණ ලබා ගන්නා අවස්ථාවේදීද එහි සඳහන් කරුණු වාර්තාවේ ඇතුලත් වී නොමැති නම් ඒ පිළිබඳව ගැටළුකාරී තත්වයක් උදා වෙනවා.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**

ඉදිරියේදී වැදගත් කරුණු ඇත්නම් ඒවා ඇතුලත් කර සිටිමු.

**ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)**

පසුගිය සභා වාරයේදී ගරු උප සභාපතිතුමා ඉදිරිපත් කළ මාළු වෙළඳසැල පිළිබඳ කරුණු සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී ආනන්දරාජ් මැතිතුමා විසින් අදහස් දැක්වූ බවට පමණක් සඳහන් වෙනවා. එම වෙළඳසැල එම ස්ථානයේ පවත්වාගෙන යනවාද? එසේ නොමැති නම් ඉවත් කරනවාද යන්න පිළිබඳව අපි තීරණයක් ලබා ගත්තා කියන්න යම්කිසි සාක්ෂියක් අවශ්‍යයි නේද?

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**

මෙම කරුණාව සම්බන්ධයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා සමඟද සාකච්ඡා කර එම නිලධාරීන්ටද පැහැදිලි කර තිබෙනවා. සභාවට ආදායමක් ලැබෙන මාර්ගය සඳහා අපි බාධා නොකළ යුතුයි.

**ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)**

පසුගිය සභා වාරයේ සභා වාර්තාව නිවැරදි බවට මම යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනී කේ.ජී.කුසුමාවතී පෙරේරා මැතිතුමිය (ලං.ක.කො)**

එම යෝජනාව මම ස්ථිර කරමි.

**තීරණ අංක 01**

2022.12.12 දිනැති සභා වාර්තාව නිවැරදි හා සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

## 02. ගරු සභාපතිතුමිය විසින් කරනු ලබන විශේෂ ප්‍රකාශය.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
මීළඟට මාගේ විශේෂ ප්‍රකාශනයේදී මස්කෙළිය සහ බ්‍රවුන්ලෝ ප්‍රදේශවලට ඉඩම් ඔප්පු ලබාදීම සම්බන්ධයෙන් නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජීවන් තොණ්ඩමන් මැතිතුමා සහ ගරු රාමේෂ්වරන් මැතිතුමා වෙත යොමු කළ ඉල්ලීමට අනුව මාර්තු මස 31 දිනට පෙර ඉඩම් ඔප්පු ලබාදීමට අවශ්‍ය කටයුතු සම්පාදනය වෙනවා. ඒ අනුව ප්‍රාදේශීය සභාවේ ගොඩනැගිලි අනුමැතිය සම්බන්ධයෙන් පර්චස් දෙකකට වඩා අඩු බිම් කොටසේ ගොඩනැගිලි සඳහා මාර්තු 31 දින දක්වා නිර්දේශ ලබාදීමට සභාවේ තීරණයක් ලබා ගන්නා ලෙසට ඉල්ලා සිටිමි.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
මෙය ඉතා හොඳ කාර්යයක්. අනිවාර්යෙන් සිදු කළ යුතු දෙයක්. තවද අනවසරයෙන් ඉදිකළ ගොඩනැගිලි සම්බන්ධයෙන් පරීක්ෂාකර බලා ඉන් අනතුරුව ලබා දෙන්න.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
බොහොමයක් ගොඩනැගිලි සම්බන්ධයෙන් නඩු පවරා තිබෙනවා.

**ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)**
ඉඩම් හිමිකම් ලබා ගැනීම සම්බන්ධයෙන් අපි මිරියා කෝට්ට ප්‍රදේශයත් සම්බන්ධ කර තිබුණා. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ජීවන් තොණ්ඩමන් මැතිතුමාගේ උපදෙස් මත පසුගිය නොවැම්බර් මස 23 වැනි දින කොළඹ පිහිටි ඉඩම් ප්‍රතිශංස්කරණ කොමිෂන් සභා කාර්යාලය වෙත අපගේ ගොවිජන සංගමයේ හිටපු සභාපති ත්‍යාගරාජා මහතාව යවා තිබුණා. එම ප්‍රදේශයේ අපි 253 ක් ගොවිතැන් කර සිටිනවා. එහි කැළෑවට ගොස් ඇති ඉඩම් ප්‍රමාණය ඉඩම් ප්‍රතිශංස්කරණ කොමිෂන් සභාව වෙත පවරා ගැනීමට නියමිත බවට කථාවක් පවතිනවා. වතුකරයේ පිහිටි ඉඩම් සඳහා ඔප්පු ලබාදීම සඳහා වතු අධිකාරිය හෝ ග්‍රාම නිලධාරී මහතා ලිපියක් ලබාදිය යුතුයි. මෙම කාරණාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමිය සුදුසු ක්‍රියා මාර්ගයක් ලබාගත යුතු බවට කාරුණිකව ඉල්ලා සිටිමි.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
මාර්තු මාසයේ දී පමණ බ්‍රවුන්ලෝ ප්‍රදේශයේ නෝටන් මාර්ගයේ තත්වය පිළිබඳව මම යෝජනාවක් ඉදිරිපත් කර තිබුණා. එම යෝජනාවට අනුව එම ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට කිසිදු ලියා පදිංචියක් නොමැති බවට සඳහන් කරමින් යෝජනාව සභා සම්මත කරගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට යොමු කිරීමෙන් අනතුරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් මේ පිළිබඳව සොයා බලන ලෙසට ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දී තිබුණා. ඒ අනුව ග්‍රාම නිලධාරී වෙත මෙම කාරණාව ඉදිරිපත් කළද ඔහු මේ පිළිබඳව සම්පූර්ණ කරුණු නොදන්නා බව පැවසීමෙන් අනතුරුව මාස හයකට පමණ පසු නෝටන් මාර්ගයේ සියළු දෙනාට ඉඩම් කච්චේරියක් පිළිබඳව දැනුම්දීම ලබා දී තිබුණා. සමහර කරුණු සම්බන්ධයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ජීවන් තොණ්ඩමන් මැතිතුමාට ස්තුතිවන්ත වෙමි. ඒ කරුණු සම්බන්ධයෙන් ලැබුණු නාම ලේඛනයේ කුඩා මස්කෙළිය ප්‍රදේශයේ ඉඩම් කැබලි 70 ක් පමණ නම් කර, මස්කෙළිය ප්‍රදේශය සඳහාත් වෙන් කර තිබූ අතර නෝටන් මාර්ගයේ කිසිදු ඉඩමක් සම්බන්ධයෙන් පරිශීලනයකර නොතිබුණි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
දැනට මස්කෙළිය ප්‍රදේශයේ ඒ සම්බන්ධයෙන් කටයුතු සිදු වෙමින් පවතිනවා.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා. ප)**
ඇත්තටම මෙම ස්ථානයේ අයිතිය කාටද යන එක පැහැදිලි විය යුතුයි. මුදල් ඇති කෙනාට එක් ආකාරයකටත් මුදල් නොමැති අයට තවත් අකාරයකටත් කටයුතු කරනවා. එනිසා අදාල ස්ථාන වලට ලිපි යොමු කර විසදුමක් ලබාදෙන ලෙසට ඉල්ලා සිටිමි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
මේ සඳහා වෙනම කමිටුවක් පත්කර එම කමිටුව හරහා තමයි කටයුතු සිදු වන්නේ. එසේ නම් එම කමිටුවටයි ලිපි යොමු කළ යුත්තේ.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
මේ දිනවල මස්කෙළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් නගර ආශ්‍රිත ප්‍රදේශ සඳහා පමණක් ඉඩම් ඔප්පු ලබාදීමේ කටයුතු සිදුවෙමින් පවතිනවා. මීට අමතරව වතුකර ප්‍රදේශයේ වසර ගණනාවක් ජීවත්වන ජනතාවක් සිටිනවා. ඔවුන්ට බලපත්‍රයක් හෝ කිසිදු ලියවිල්ලක් නැහැ. මේ පිළිබඳවද අවධානය යොමු කරමින් ඔවුන්ටත් යම් බලපත්‍රයක් ලබාදීම සඳහා කටයුතු කළ යුතුයි.

උදාහරණයක් ලෙස ලකම් ප්‍රදේශයේ ජීවත්වන ජනතාව කිසිදු මාර්ගයකින් ඔවුන්ගේ රැකියාව සංවර්ධනය කරගැනීමට හෝ ගොඩනැගිල්ල සංවර්ධන කරගැනීමට නොහැකි තත්වයක් තිබෙනවා. හේතුව ඔවුන්ට ඉඩම සඳහා ඔප්පුවක් හෝ බලපත්‍රයක් නොමැති වීමයි. එවැනි ගැටළු තිබෙන අයට එම ගැටළු නිරාකරණය කරගෙන මෙම අවසාන මොහොතේ හෝ යම් ක්‍රියා මාර්ගයක් ලබා ගන්නා ලෙස ඉල්ලා සිටිමි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
මෙම කාරණාව සම්බන්ධයෙන් අපි රැස්වීමක්ද පැවැත්වූවා. ඉන් පසුව ඒ සඳහා කිසිදු ක්‍රියා මාර්ගයක් ලබා ගත්තේ නැහැ. මේ පිළිබඳව ක්‍රියාමාර්ගයක් ලබා ගනිමු.

**තීරණ අංක 02**
අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ වැඩ සටහන යටතේ 2023 මාර්තු 31 දිනට පෙර ඉඩම් ඔප්පු ලබාදීමේ වැඩ සටහන කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා වූ රැස්වීමේ සාකච්ඡා කළ පරිදි මස්කෙළිය නගරයේ පර්චස් 02 ට අඩු පුද්ගලයන්ගේ ගොඩනැගිලි සැලසුම් සඳහාද නිර්දේශ ලබාදීමට සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 03. සභාව වෙත ලැබී ඇති ලිපි සහ පැමිණිලි සභාවට ඉදිරිපත් කිරීම.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
මීළඟට සභාවට ලැබී ඇති ලිපි සහ පැමිණිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමි.

**ලිපි අංක 01**
යොමු කරන්නා - ගරු උප සභාපති පී.පී. ප්‍රදීපන් මැතිතුමා.
විෂය - 2022.01.09 දිනැති සභා රැස්වීම සඳහා සහභාගිවීමට නොහැකි බව දන්වන ලද නිවාඩු ලිපිය.

**ලිපි අංක 02**
යොමු කරන්නා - ගරු මන්ත්‍රී කේ. නිත්‍යනාදන් මැතිතුමා.
විෂය - 2022.01.09 දිනැති සභා රැස්වීම සඳහා සහභාගිවීමට නොහැකි බව දන්වන ලද නිවාඩු ලිපිය.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගරු මන්ත්‍රීවරුන්ගේ නිවාඩු ඉදිරිපත් කිරීම මා විසින් යෝජනා කර සිටිමි.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)</u>**
එය මා විසින් ස්ථිර කර සිටිමි.

**තීරණ අංක 03**
ගරු මන්ත්‍රීවරුන්ගේ නිවාඩු සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**ලිපි අංක 03**
යොමු කරන්නා - වනජීවි දෙපාර්තමේන්තුව.
විෂය - මස්කෙළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දක්නට ලැබෙන සර්පයින් සහ වඳුරන්ගෙන් සිදුවන හානිය පිළිබඳ වූ ලිපිය.

**ලිපි අංක 04**
යොමු කරන්නා - පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය.
විෂය - දීපාවලී උත්සවය සමයේදී කඩකාමර ටෙන්ඩර් මඟින් ලබාදීම පිළිබඳ වූ ලිපිය.

## 04. මුදල් සහ අනෙකුත් කමිටු වාර්තා ඉදිරිපත් කිරීම.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
මීළඟට මුදල් සහ අනෙකුත් කමිටු වාර්තා සභාවට ඉදිරිපත් කරමු.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මුදල් කමිටු වාර්තාවේ සඳහන් සාමිමලේ පුස්තකාලයේ පුවත්පත් මිළදී ගැනීම, සාමිමලේ පුස්තකාලයේ පවතින අඩුපාඩු සහ පොත්වල අඩුපාඩු පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් අදහස් ඉදිරිපත් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
රිකාටන් කසළ කළමණාකරන මධ්‍යස්ථානයේ සේවයේ කරනු ලබන සේවකයින් පිළිබඳව අවධානය යොමු කරන ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් අදහස් දක්වන ලදී.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මුදල් කමිටු වාර්තාව නිවැරදි බවට මම යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී ටී.වසන්තකුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
එම යෝජනාව මා ස්ථිර කරම

## 05. යෝජනා

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
මීළඟට ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

මාගේ පළමු වන යෝජනාව වන්නේ රිකාටන් කසළ කළමණාකරන මධ්‍යස්ථානය සම්බන්ධවයි. අපගේ සභාව ආරම්භ කර දැනට අවුරුදු 05 ක් ගත වී තිබෙනවා. මෙම කසළ කළමණාකරන මධ්‍යස්ථානය පිහිටා තිබෙන්නේ මස්කෙළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුලයි. නමුත් මෙම කසළ කළමණාකරන මධ්‍යස්ථානය ආරම්භ කළේ අඹගමුව ප්‍රාදේශීය සභා කාළය තුලයි. එනිසා මෙය අපට පවරා දී තිබෙනවාද?, නැතිනම් අඹගමුව ප්‍රාදේශීය සභා පරිපාලනය යටතේ තිබෙනවාද? යන්න සැකයක් මතුව තිබෙනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**

ගරු මන්ත්‍රීතුමනි, මෙම සභාව වෙන් කරන අවස්ථාවේදී සභාවට අදාල සියළු ලිපි ලේඛන අපට භාරදී තිබිය යුතුයි. නමුත් සමහර ලිපි ලේඛන භාරදී නැහැ. මෙම ලිපි ගොනු අපට නොලැබුණු බව පවසා කොමසාරිස්තුමාටත් ලිපි යොමුකර තිබෙනවා. විමර්ශන නිලධාරී මහතාටත් මේ පිළිබඳව දැනුම්දී තිබෙනවා. එම මධ්‍යස්ථානයේ සියළුම නඩත්තු සහ අළුත්වැඩියා කටයුතු අප විසින් සිදු කරනු ලබනවා. මෑතකදී රිකාටන් කසළ කළමණාකරන මධ්‍යස්ථානය පිහිටි ඉඩම සම්බන්ධයෙන් වනජීවී දෙපාර්තමේන්තුවේ මතු වූ ගැටළුවකදී වුවද අප සතුව ලිපි ගොනු තිබුණේ නැහැ. එම ගැටළුව සම්බන්ධයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ජීවන් තොණ්ඩමන් මැතිතුමා වෙත අප පැහැදිලි කිරීමෙන් අනතුරුව වනජීවී දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡාකර සභාවේ කසළ බැහැර කිරීම සඳහා තවත් බිම් කොටසක් ලබාදෙන ලෙස ඉල්ලා සිටියා. මේ සම්බන්ධයෙන්ද ලිපියක් යොමුකර තිබෙනවා. පසුගිය සතියේ 26 වන දින අප ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා සහ අඹගමුව ප්‍රාදේශීය සභවේ ලේකම්තුමා සම්බන්ධකර ගිවිසුමකට යොමු කිරීම සඳහා සහකාර කොමසාරිස්තුමා කැඳවා තිබුණා. මම යවන්න බැහැ කියා පැවසුවා. JCB යන්ත්‍රයට අවශ්‍ය ලිපිය පමණක් නිකුත් කළ හැකි බව මම පැවසුවා. ඉතා කඩිනමින් මෙම කාරණාව සම්බන්ධයෙන් කටයුතු කරන බවට පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා පවසා තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

ඇත්තෙන්ම කියනවානම් අඹගමුව ප්‍රාදේශීය සභාවට අනුව කසළ කළමණාකරන මධ්‍යස්ථානය පමණක් නොවෙයි ශ්‍රී පාදස්ථානයත් ඒ අයගේ පාලනය යටතේ තිබිය යුතු නිසා මුල සිට ඒ අය අතහරින්නේ නැහැ. සභාව ආරම්භ කර දැනට වසර 05 ක් ගතවෙලත්, තවමත් ලිපි ලේඛන භාරදී නැහැ කියන එක කණගාටුදායක තත්වයක්. මේ පිළිබඳව සියළු දෙනාම දන්නවා. නමුත් මෙපමණ කාලයක් මෙම ගැටළුව සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් නොගත්තේ ඇයි කියා දන්නේ නැහැ. දමිළ සභාපතිතුමියක් යටතේ පාලනය වන සභාවක් නිසා දිය යුතු නැති බවට සිතනවාද, එසේ නොමැති නම් එකී කසළ කළමණාකරන මධ්‍යස්ථානය තමන්ගේ පාලන යටතේ තබාගෙන සංවර්ධන කිරිමට මෙහෙම කරනවාද දන්නේ නැහැ. කඩිනමින් මෙම කාරණාව පිළිබඳව කටයුතු කළ යුතුයි. එසේ නොමැති නම් මීළඟට පිහිටුවන සභාවට මෙය බරක් වෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)</u>**

මෙම සභාව ආරම්භ කර අවුරුදු 05 ක් වෙනවා. මෙම සභාවට අයත් සියළු දෑ අපගේ බලය යටතේ පැවතිය යුතුයි. එනිසා මෙය විධිමත්ව අපගේ සභාවට පවරාදීම සඳහා ඒකමතික තීරණයක් ලබා ගන්නා ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

රිකාටන් කසළ කළමණාකරන මධ්‍යස්ථානයට වෙනත් සභා වලින් කසළ රැගෙන ඒම, ඒවා අත්හිටුවීම සම්බන්ධයෙන් පසුගිය සභා වලදී මමත් අදහස් ප්‍රකාශ කර තිබුණා. එමෙන්ම රිකාටන් කසළ කළමණාකරන මධ්‍යස්ථානයේ දියත් කරන ක්‍රියාවන් සම්බන්ධයෙන් ද සඳහන් කර තිබුණා. ගරු සභාපතිතුමියනි, මෙම සිද්ධිය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනාවක් ඉදිරිපත් කර සාකච්ඡා කරන තුරු පරිපාලන අංශයේ ක්‍රියාකාරිත්වය නොසැළිකිළිමත්ව සිටියා කියන එකයි මගේ අදහස.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**

ගරු මන්ත්‍රීතුමනි, මෙම කාරණාව පිළිබඳව විවිධ අවස්ථාවලදී සෘජුවම සහ ලිපි මඟින් දැනුම් දී තිබෙනවා.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

ලිපි යොමුකර තිබෙනවා. අපට ආර්ථික වශයෙන් ප්‍රධාන සාධකයක්ව බලපාන මෙම මධ්‍යස්ථානය අපගේ බලය යටතේ පවත්වා ගැනීමට නොහැකි වීම එතක්තරා ගැටළුවක්ව පවතිනවා. මෙතෙක් ලබා ගන්නා ලද කිසිදු උත්සහායක් සාර්ථක නොවීම නිසා අපි සියළු දෙනා එක්ව කසළ කළමණාකරන මධ්‍යස්ථානයේ පාලන බලය අපට ලබාදෙන ලෙසට සභාව ඉදිරියේ ඉල්ලීමක් කළ හැකියි.මේ සඳහා සියළු දෙනා සහයෝගය ලබාදිය යුතුයැයි ඉල්ලා සිටිමි. එසේ සිදු නොවන්නේ නම් ඊට බාධා කරන්නේ කවුද කියන එක සොයා බැලිය යුතුයි. මම සහ ලේකම්තුමා ට්‍රැක්ටර් රථය සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය වෙත ගිය අවස්ථාවේදී මෙම සංවර්ධනය කිරීම සඳහා විශාල උදාහරණ සංඛ්‍යාවක් පෙන්වා සිටියා. අපගේ ආර්ථිකය ශක්තිමත් කරන මාර්ගය අපට බාධා කරන්න බැහැ.

**තීරණ අංක 04**

රිකාටන් කසල කළමණාකරන මධ්‍යස්ථානයට සම්බන්ධ සියළු ලියකියවිලි මස්කෙළිය ප්‍රාදේශීය සභාවට ලබාදෙන ලෙසට ඉල්ලා ගරු ආණ්ඩුකාරතුමා සහ පළාත් පාලන කොමසාරිස්තුමා වෙත නැවත ලිපියක් යොමු කිරීමට තීරණය කරන ලදී.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**

ගලි යන්ත්‍රය ලබා ගැනිම සම්බන්ධව මාගේ මීළඟ යෝජනාව ඉදිරිපත් කර තිබෙනවා. ඇත්තෙන්ම ගලි යන්ත්‍රය සම්බන්ධයෙන් සියළුම ගරු මන්ත්‍රීවරුන් බලපෑම් කර තිබුණද මේ සඳහා පළමු අත්තිවාරම ගොඩනැගුවේ ගරු මන්ත්‍රී කේ. රාජ්කුමාර් මැතිතුමා 2108.05.28 දින මෙතුමාගේ යෝජනාව ඉදිරිපත් කර තිබෙනවා. මස්කෙළිය ප්‍රාදේශීය සභාව වෙත ගලි යන්ත්‍රයක් ලබාදිය යුතු බවට යෝජනාවක් ඉදිරිපත් කර තිබුණා. එය පිළිගනිමින් ගරු මන්ත්‍රී පී. රාජ්කුමාර් මැතිතුමා ද අදහස් ඉදිරිපක් කර තිබුණා. සියළුම මන්ත්‍රීවරුන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කර තිබුණා. මේ සියළු දෙනාගේ අදහස් පිළිගනිමින් සභාවේ අරමුදල යොදවා ගලි යන්ත්‍රයක් මිළදී ගැනීම සතුටට කරුණක්. මෙය අපි ජනතාව වෙනුවෙන් ඉටු කරන විශාල සේවාවක් වෙනවා. ගලි යන්ත්‍රය පිළිබඳව සඳහන් කරනවා නම් මස්කෙළිය සභාවට මින් පසුව ලබා දෙන්නේ නැහැ කියලා අඹගමුවෙන් පවසා තිබුණා. ඇයි එහෙම කිවුවේ කියලා දන්නේ නැහැ, මෙම ගලි යන්ත්‍රය සභාවට ලබා දුන් ගරු සභාපතිතුමියටත්, ලේකම්තුමාටත්, ගරු මන්ත්‍රීවරුන්ටත්, නිලධාරීන්ටත් සභාව වෙනුවෙන් මාගේ ස්තූතිය පුදකරමි.

**ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

අපගේ සභාව අඹගමුව ප්‍රාදේශීය සභාවෙන් කොටස් 03 කට වෙන්කර මස්කෙළිය ප්‍රාදේශීය සභාවෙන් විශාල ආදායමක් අඹගමුව ප්‍රාදේශීය සභාවට ලබාදී තිබෙනවා. සභාව වෙන්කර අපගේ සභාව ආරම්භ කරන අවස්ථාවේදී අපට ලබාදිය යුතු කිසිදු සම්පතක් නිසි ආකාරයෙන් ලබා දුන්නේ නැහැ. 2018.05.28 කාලවකවානුවේදී මම මේ පිළිබඳව සභාවේ පැහැදිලිව අදහස් ඉදිරිපත් කර තිබුණා. සභාවට පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා පැමිණ සිටි අවස්ථාවේදීද මේ සම්බන්ධව මම කතා කර තිබුණා. මහජන මුදලින් ගලි යන්ත්‍රයක් ලබා ගැනීම සඳහා අවුරුදු 05 ක් ගතවී තිබෙනවා. මෙම යන්ත්‍රය ලබා ගැනීම සඳහා තලවකැළේ, හැටන්, අඹගමුව වැනි ස්ථානවලට ගොස් මෙම යන්ත්‍රය ලබා ගැනීමට සිදු වුණා. කසළ කළමණාකරනය විධිමත්ව සිදු කරන්නේ අපෙන්. මහජන මුදලින් ගලි යන්ත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය සියළු කටයුතු සිදුකළ ගරු සභාපතිතුමිය, ලේකම්තුමා ඇතුළු සියළුම මන්ත්‍රීවරුන් සහ නිලධාරීන් වෙත මාගේ ස්තූතිය පුදකරමි.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

ගරු මන්ත්‍රී රාජ්කුමාර් මැතිතුමා යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධව මම දන්නේ නැහැ. ඊට මාස හයකට පසුව මෙම යෝජනාව මම නැවතත් සභාවට ඉදිරිපත් කළා. එදින තීරණයක් ලබාගෙන සියළු දෙනාට ලිපි යොමු කරන ලෙසට මම ඉල්ලා සිටියා. එය මාගේ මුහුණු පොතේ ද සඳහන් කර තිබුණා. ඉන්පසුව වත්මන් ආණ්ඩුකාරතුමා හමුවීමට අවස්ථාවක් ලැබුණ අවස්ථාවේදී ඔබතුමියද ලිපිගොනුවක් භාරදී තිබුණා. මමත් පෞද්ගලිකව මස්කෙළිය රෝහල සහ ගලි යන්ත්‍රය සම්බන්ධයෙන් ලිපියක් ඉදිරිපත් කළා. ඒ අවස්ථාවේදී සභාව සහ මුදල් කමිටුව එක්ව සහයෝගයෙන් කටයුතු කර තිබුණා. මෑතකදී ඔබතුමිය මුහුණු පොතේ සටහන් කර තිබූ පණිවිඩය නිසා මට විශාල හිත් රිදීමක් ඇතිවුණා. ඉන්පසුව තමයි මමත් සියළු දෙනාම සඳහන් කර ස්තූති පණිවිඩයක් යොමු කර තිබුණේ.

**ගරු සභාපතිනී ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**

අපි ආණ්ඩුකාරතුමාට ලිපි යොමුකර තිබුණා. ඍජුවම ගොස් හමු වුණා. සියළු කටයුතු අපි විසින් සිදුකර තිබුණා. ඉන් අනතුරුව මම සහ ලේකම්තුමා තාක්ෂණ නිලධාරී සමඟ පල්ලේකැලේට ගියා. එහිදී බැංකු ණය සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධව විවිධ ගැටළු වලට මුහුණ දුන්නා. නොයෙකුත් අවස්ථා වලදී මෙවැනි ගැටළු වලට මුහුණ දීමට සිදු වුණා. සෑම අවස්ථාවකදීම මේ පිළිබඳව මට කියකියා ඉන්න බැහැ. එක්තරා අදහසක් ඉදිරිපත් කිරීම පහසුයි. නමුත් එය ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දීමට සිදුවන ගැටළු තේරෙණවා.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

මම සහ ගරු මන්ත්‍රී රාජ්කුමාර් ඇතුළු අනෙකුත් සියළු මන්ත්‍රීවරුන් එක්ව තමයි වාරික ගෙවීම යටතේ ගලි යන්ත්‍රය ලබා ගනිමු යැයි පවසා තිබුණේ. අපි මේ සඳහා මහන්සි වුණු බව මම සඳහන් කළේ නැහැ. සියළු දෙනාගේ මහන්සිය තුලින් මෙය ලබා ගැනිමට හැකි වුණා කියලයි පැවසුවේ.

**ගරු මන්ත්‍රී එස්.ඒ.දිසානායක මැතිතුමා (ශ්‍රී ලං.පො.පෙ)**

ගරු සභාපතිතුමියනි, ඔබතුමිය සභාපති ලෙස පත්ව සිටිනවා. යම් ආයතනයකට ගොස් භාණ්ඩයක් මිළදී ගැනීමට නම් රාජකාරී මට්ටමින් කැපවී එය ලබා ගත යුතුයි. එය ඔබතුමියගේ වගකීම. එමෙන්ම එක් එක් කොට්ඨාශ වලින් මහජන නියෝජිතයන් ලෙස පත්ව සිටින මන්ත්‍රීවරුන්, මහජනතාවට අවශ්‍ය දේ සභාවේ යෝජනා කර අඩුපාඩු පෙන්වා දීමයි මන්ත්‍රීවරුන්ගේ වගකීම. සියළු දෙනාගේ කැපවීම මත යම්කිසි දෙයක් මෙතැනත් කොහෙන් හෝ ලැබී තිබෙනවා. මෙහිදී මම කරා කියා අංක දමාගත නොහැකියි. අපිටත් කොපමණ රාජකාරී වැඩ තිබුණත් අවශ්‍ය අවස්ථාවලදී පැමිණ අවශ්‍ය දේ සඳහා යොමුවී ඒ සඳහා අප කැපවී තිබෙනවා. මෙහිදී සභාවේ සිටින සියළුම මන්ත්‍රීවරුන් සඳහා ඒ අයිතිය ඒ උරුමය ලැබිය යුතුයි. ගරු සභාපතිතුමියට කිව නොහැකියි මම කළා, මම විතරයි එය සිදු කළේ කියා. ඔබට තනතුරක් තිබෙනවා නම් එහි ප්‍රධානියා හැටියට එම ආයතනයට ගොස් එය ලබා ගැනීමයි ඔබගේ වගකීම. ඒ දේ කළ යුතුයි. මහජනතාවට එයින් යම් හොඳ දෙයක් සිදු වනවා නම් එයයි අපේ බලාපොරොත්තුව. එය ඉටුවනවා නම් මහජනතාව විසින් මන්ත්‍රීවරුන් සඳහා ලැබිය යුතු ප්‍රසාදය ද ලබාදෙයි.

**ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)**

මෙම සභාව අති විශාල ජයග්‍රහණයක් ලබාගෙන ඇති බවට පැවසිය යුතුයි. සභාව ආරම්භ කර පළමුවන වසරේදී මෙම යෝජනාව ඉදිරිපත් කර තීරණයක් ලබාගෙන, අවුරුදු දෙකකට පෙර මෙය ලබාගෙන තිබුණානම් සභාවට අති විශාල ආදායමක් ලබා ගන්න තිබුණා. පළාත් පාලන ආයතන අගතියක් කරන බවට පසුගිය කාලයේදී මම පැවසුවා. විශාල දුෂ්කරතා වලට මුහුණ දෙමින් මෙය ලබාගත් බවට ගරු සභාපතිතුමිය පැවසුවා. කම්කරුවන් බඳවා ගනීමත් ප්‍රමාද වී තිබෙනවා. මෙම යන්ත්‍රය ලබා ගැනීමට දායක වූ සියළුම දෙනාට මෙම අවස්ථාවේදී මාගේ ස්තූතිය පුදකරමි.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

ගලි යන්ත්‍රයක් ලබාදීම සම්බන්ධයෙන් ස්තූති වන්ත වන අතර JCB යන්ත්‍රයක් සහ ජල බවුසරයක් මිළදී ගැනීමටත් අපි කටයුතු කළ යුතුයි. JCB යන්ත්‍රයක් තිබේ නම් එයින්ද සභාවට විශාල ආදායමක් උපයා ගත හැකි වෙනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**

ජල බවුසරයක් ලබා ගැනීම සඳහා ලිපියක් යොමු කර තිබෙනවා. සෘජුවම කතා කරලත් තිබෙනවා. එයද කඩිනමින් ලබා ගත හැකි බවට මම විශ්වාස කරනවා.

## 06. අනෙකුත් කරුණු, විශේෂ දැනුම්දීම් සහ ඉදිරි සභා රැස්වීම සඳහා දිනය දැනුම් දීම

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

සීමා නිර්ණය කිරීම සම්බන්ධයෙන් රජය විසින් දැනටමත් විවිධ ක්‍රියාමාර්ග ගනු ලබමින් තිබෙනවා. කොට්ඨාශ දෙකක් එකට සම්බන්ධ කර එමඟින් කටයුතු කිරීමට සැලසුම් කරමින් පවතිනවා. එනිසා වැඩි අවාසියක් සිදු වන්නේ කඳුරට ප්‍රදේශයේ ජීවත් වන අපටයි. මෙහි පිහිටි කොට්ඨාශවල අධික ජන ගහණයක් ජීවත් වෙනවා. අනෙකුත් ප්‍රදේශවල මෙවැනි තත්වයන් බොහෝ දුරට අඩුයි. 9000 ක් ඇතුලත් එක කොට්ඨාශයක් වශයෙන් අප තේරී පත් වෙනවා. අනෙකුත් ප්‍රදේශ 3000 ක 4000 ක් ඇත්ලත් කොට්ඨාශ වශයෙන් පවතිනවා. එනිසා මෙම සීමා නිර්ණය කිරීම අපට අවාසි සහගතයි. මෙය සිදු වූයේ ඉතා රහසිගතවයි. දේශපාලන පක්ෂ නියෝජිතයන් කැඳවා මේ පිළිබඳව සාකච්ඡා කළ අවස්ථාවේදී අපගේ ද්‍රවිඩ දේශපාලන පක්ෂ නියෝජිතයින් මෙයට විරෝධය පල කර තිබෙනවා. සීමා නිර්ණය කිරීමක් සිදු කරන්නේ නම් එය අපගේ ප්‍රදේයට සුදුසු පරිදි සහ මුළු ශ්‍රී ලංකාවේම ඡන්දදායකයන් පදනම් කර ගනිමින් සීමා නිර්ණය කරන පරිදි අප ප්‍රදේශයටත් සිදු කළ යුතු බවට ප්‍රකාශ කරමි. ශ්‍රී පාදස්ථානය සහ කසළ කළමණාකරන මධ්‍යස්ථානය අපගේ සභාව හැර වෙනත් ප්‍රාදේශීය සභාවකට යයි කියන එකට කිසිදු සැකයක් නැහැ. එනිසා තමයි මම මෙම යෝජනාව ඉදිරිපත් කරන්නේ.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව මා ස්ථිර කරන අතර මෑතකදී හිටපු මැතිවරණ කොමසාරිස්තුමාගේ ප්‍රධානත්වයෙන් පත්කරන ලද සීමා නිර්ණය කමිටුව විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග ප්‍රතික්ෂේප කරමින් ද්‍රවිඩ පක්ෂ අදහස් ඉදිරිපත් කර තිබුණද කිසිදු සංවිධානයක් සීමා නිර්ණය කමිටුව සම්බන්ධයෙන් සම්පූර්ණ නිර්දේශයක් ලබා දුන්නේ නැහැ. යෝජනා කැඳවා තිබුණා. මස්කෙළිය බල ප්‍රදේශයතුල කොට්ඨාශ සංඛ්‍යාව සහ මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව පිළිබඳව වැඩි අවධානයක් යොමුකළ යුතු අවශ්‍යතාවයක් පැන නැගිලා තිබෙනවා. උතුරු නැගෙනහිර ප්‍රදේශවල පහිටි පළාත් පාලන ආයතනවල ඉදිරිපත් කරන සියළු යෝජනා මෙම සමාජය නියෝජනය කරන යෝජනා වෙනවා. මෑතකදී අපගේ ප්‍රාදේශීය සභාවල සංඛ්‍යාව වැඩි කර බලය බෙදා දී තිබුණද අප විසින් ඉදිරිපත් කරන අයිතීන් පිළිබඳවූ කරුණු ඉතාමත් අඩුයි. සමහර කරුණු සම්බන්ධයෙන් අපි වහාම තීරණයක් ලබා දුන්නාම අපගේ සමාජය ඉහළ තලයට ගොස් ඇති බවට අපි හිතා ගන්නවා. නමුත් අද දින ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ඉතා කාලෝචිතයි. මාගේ කොට්ඨාශයේ වැඩි ඡන්ද දායකයින් පිරිසක් සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)</u>**

ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව පිළිගන්නා අතර මෙම සීමා නිර්ණය කිරීමේ කටයුත්ත නිසා පසුගිය කාලයේ අපගේ ප්‍රදේශ වලට විශාල බලපෑමක් සිදු වුණා. මිට පෙරදීද මේ සම්බන්ධයෙන් අපි මේ සභාවේ කතාකර තිබෙනවා. අඹගමුව ප්‍රාදේශීය සභා කාලයේදී එකට තිබුණු ග්‍රාම සේවක වසම් කොටස් දෙකකට කැඩුණු බව පසුගිය මැතිවරණ සමයේදී අපි දැක්කා. මේ නිසා හදිසියේ ලේඛනයක් සක්සකර මේ සම්බන්ධයෙන් මතුවන ගැටළු උපුටා දක්වමින් ලිපියක් යොමු කිරීම අවශ්‍යයි.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
දැනට පවතින සීමා නිර්ණය තුල සමෘද්ධි ව්‍යුහයේ ගැටළු පවතිනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
මේ සම්බන්ධයෙන් අපි සමෘද්ධි අමාත්‍යාංශය වෙත ලිපියක් යොමුකර තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
උතුරු නැගෙනහිර ප්‍රදේශවල 300 දෙනෙකුට එක් ග්‍රාම සේවක නිලධාරී වසමක් පිහිටා තිබියදී ඔවුන්ටත් මෙය ගැටළුවක් වී තිබෙනවා. අපගේ ප්‍රදේශයේ එක් ග්‍රාම සේවා වසමක 7000 ක් සිටිනවා. ග්‍රාම සේවා වසම් දෙකක් ගතහොත් දළ වශයෙන් 14000 ක් සිටිනවා. වෙනත් ප්‍රදේශවල මහජනතාව 10000 කට එක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් තිබෙනවා. එබැවින් මේ පිළිබඳව නිවැරදි තීරණයක් ලබා ගන්න.

**තීරණ අංක 05**
සීමා නිර්ණය කාරණාව පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමා වෙත සහ සීමා නිර්ණය කමිටුවේ සභාපතිතුමා වන මහින්ද දේශප්‍රිය මැතිතුමා වෙතද ලිපි යොමු කිරීමට තීරණය කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
මාගේ මීළඟ යෝජනාව වන්නේ විදුලි බිල් ගාස්තු වැඩි කිරීම සම්බන්ධවයි. මේ කාරණාව සම්බන්ධයෙන් මෙහිදී සාකච්ඡා කළ යුත්තේ ඇයි කියන එක පිළිබඳව බොහෝ දෙනෙක් කල්පනා කරයි. හේතුව අනිවාර්යයෙන් කතා කළ යුතුයි. විදුලි බිල් ගාස්තු කොහොමද වැඩි වෙන්නේ කියන එක පිළිබඳව සියළු දෙනා දැනගෙන සිටිය යුතුයි. ඒ කියන්නේ එකට 03 ක ප්‍රතිශතයක් වශයෙන් වැඩි වීමට නියමිතයි. විදුලි ගාස්තු අනිවාර්යයෙන් වැඩි කිරීමට නියමිත බව විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා පවසා තිබෙනවා. විදුලිබිල වැඩිවීමෙන් අනෙකුත් සියළුම භාණ්ඩවල මිල වැඩි වෙනවා. කුඩා කර්මාන්ත කරුවන්ගේ නිෂ්පාදන අත්හිටුවීමට සිදු වෙනවා. මෙහි පිහිටි ජලාශ මඟින් තමයි මුළු රටටම විදුලිය ලබා දෙන්නේ. එසේ තිබියදී විදුලි බිල වැඩි කිරීම හේතුවෙන් විශාල අර්බුධයකට මුහුණ දීමට සිදු වන්නේ වතුකරයේ ජනතාවටයි. මේ සඳහා වූ ක්‍රියාමාර්ග කොටස් වශයෙන් ලබා ගන්න තිබුණා. සහන ලබාදුන් බවට පසුගිය කාලයේදී පැවසුවා. රටතුල ආර්ථික තත්වය සැලකිල්ලට ගනිමින් සම්පූර්ණ බර ජනතාව මත පැටවීම කණගාටුවට කරුණක්. මෙම විදුලි ගාස්තු වැඩිකිරීම සම්බන්ධයෙන් අපගේ විරෝධය පළ කරන බවට ලිපියක් යොමු කරන ලෙසට ඉල්ලා සිටිමි.

**තීරණ අංක 06**
විදුලි ගාස්තු වැඩි කිරීම හේතුවෙන් වතු කරයේ ජනතාවට මුහුණදීමට සිදුවන ගැටළු සම්බන්ධයෙන් විදුලි බල හා බලශක්ති අමාත්‍යතුමා වෙත ලිපියක් යොමු කිරීමට තීරණය කරන ලදී.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
මේ සමඟ අද දින සභා කටයුතු සාමකාමීව පවත්වාගෙන යාම සඳහා සහයෝගය ලබාදුන් ඔබ සැමට ස්තූතියි. මෙයින් සභා රැස්වීම් කටයුතු අවසන් කරමි.

සභාපති,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.

ලේකම්,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.